ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>රවින්ද්‍රනාත් තාගෝර්තුමාගේ ජන්ම සංවත්සරය ශ්‍රී ලංකාවේදී සැමරේ</u>**

නොබෙල් සම්මානලාභී ගුරුදේව් රවින්ද්‍රනාත් තාගෝර්තුමාගේ 159වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් එතුමාට උපහාර පිණිස ශ්‍රී ලාංකික සහ ඉන්දියානු කලාකරුවන්ගේ 'ඔන්ලයින්' ඉදිරිපත් කිරීම් මාලාවක් සංවිධානය කර තිබිණ. නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මැතිතුමා මැයි 8 වන දින මෙම සැමරුම සමාරම්භ කරමින් ගුරුදේවයන්ට පුෂ්පෝපහාර දැක්වීය.

2. මෙම අවස්ථාවේදී නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා විසින් වැඩ බාර ගැනීම පිණිස මැයි 8 වන දින ශ්‍රී ලංකාවට පැමිණි නව ඉන්දීය මහ කොමසාරිස්තුමාගේ පණිවිඩයක් ඉදිරිපත් කරන ලදී. තාගෝර්තුමාගේ 159 වන ජන්ම සංවත්සරය වෙනුවෙන් සුබ පැතුම් එක් කරමින්, මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කරන ලද්දේ ගුරුදේවයන්ගේ නිර්මාණ සහ දැක්ම සමස්ත මානව වර්ගයා සඳහා සාරගර්භ උරුමයක් වන බවයි. 19 වන සහ 20 වන ශතවර්ෂයන්හි බෙංගාලයේ පහළ වූ ස්වාමි රාමක්‍රිෂ්ණ පරම්හන්ස්, ස්වාමි විවේකානන්ද සහ ගුරුදේවයන් ඇතුළු ශ්‍රේෂ්ඨයන්ගේ ජීවිත සහ නිර්මාණයන් විසින් මතුකළ ප්‍රභාලෝකයේ උරුමකරුවන් වීම සෑම ඉන්දියානුවකුගේම අභිමානයට කරුණක් බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කර තිබිණ. එසේම මහ කොමසාරිස්තුමා මෙම අගනා උරුමය ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ගෙන ඇති ප්‍රයත්නයන් පිළිබඳව සිය සතුට පළ කර තිබිණ.

3. ගුරුදේව් තාගෝරයන් ශ්‍රී ලංකාව සමඟ ශක්තිමත් සබඳතාවයක් පැවැත්වීය. එතුමා 1922, 1928 සහ 1934 යන වර්ෂ වලදී ශ්‍රී ලංකාවට පැමිණි අතර දෙරටෙහි සමාජ සංස්කෘතික සම්බන්ධතාවයට විශාල බලපෑමක් ඇති කිරීමට සමත් විය. එතුමාගේ අවසන් විදේශ සංචාරය වූයේද ශ්‍රී ලංකාවයි. ගුරුදේවයන් විසින් ශාන්ති නිකේතනයේ පිහිටුවන ලද විශ්ව භාරතී විශ්ව විද්‍යාලය ආනන්ද සමරකෝන් ශූරීන් ඇතුළු ශ්‍රී ලාංකික කලාකරුවන් සහ විද්වතුන් රැසකගේ ආකර්ෂණයට පාත්‍ර වී ඇත. මෙම කලාකරුවන් සහ විද්වතුන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සංස්කෘතික සබඳතා වැඩිදියුණු කිරීම වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබා දී තිබේ. ගුරුදේවයන් හා ශ්‍රී ලංකාව අතර පැවති ගැඹුරු සබඳතාවය අනුස්මරණය කරමින් ඉන්දියානු ප්‍රදාන යටතේ රුහුණ විශ්ව විද්‍යාලයේ ඉදිකරන ලද ආසන 1,500කින් යුත් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් සතු විශාලතම ශ්‍රවණාගාරය රවින්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය ලෙස නම් කර ඇත.

4. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයද සිය සමාජ මාධ්‍යයන් ඔස්සේ විවිධ වාර්තාමය වැඩසටහන් සංවිධානය කර තිබිණ.

*****

කොළඹ

ශක වර්ෂ 1942 වෛශාක 19

2020 මැයි 09